# මැතිවරණ කොමිෂන් සභාව

## ඇබෑර්තු - නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)

මැතිවරණ කොමිෂන් සභාවේ 2026.07.15 දින සිට පුරප්පාඩුවීමට නියමිත නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) තනතුර සඳහා සුදුසු නිලධාරියකු ස්ථාන මාරු කරවා ගැනීම පිණිස අයදුම්පත් කැඳවනු ලැබේ.

***අයදුම්කරුවන් :***

- ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ II ශ්‍රේණියේ නිලධාරියකු විය යුතුය.
- තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
- විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
- කිසිදු දේශපාලන පක්ෂයක් සමග හෝ දේශපාලන කටයුතුවල ක්‍රියාකාරීව යෙදෙන අයෙකු නොවිය යුතු අතර ආයතන සංග්‍රහයේ XXXII පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතුය.
- අනුප්‍රාප්තිකයකු රහිතව හෝ අනුප්‍රාප්තිකයකු පසුව ලබාදීමේ පදනම මත නිදහස් කිරීමට ආයතන ප්‍රධානියා විසින් එකඟත්වය පළකර තිබිය යුතුය.
- අවම වශයෙන් වසර 4ක කාලයක්වත් මැතිවරණ කොමිෂන් සභාව යටතේ සේවය කිරීමට එකඟත්වය පළ කළ යුතුය.

අයදුම්පත් තම ජීව දත්ත තොරතුරු ද සමග 2026.08.15 දින හෝ ඊට පෙර මැතිවරණ කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර අයදුම්පත එවනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ **"නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) තනතුරු පුරප්පාඩු පිරවීම"** යනුවෙන් සඳහන් කළ යුතුය.

**එච්.එම්.ටී.ඩී.හේරත්,**
ලේකම්,
මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.